අධ්‍යාපන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්**

**තනතුරුවලට පත්කිරීම - 2024**

1925/37 හා 2015.07.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ සහ එයට වරින්වර සිදු කරන ලද සංශෝධනවල සඳහන් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19 ක සහ ගුරු විද්‍යාල 05 ක 2024.06.30 දිනට උපලේඛන I හි සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පත්කිරීමට ඒ සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් වෙතින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "සහකාර ලේකම්, ගුරු අධ්‍යාපනඥ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත්කිරීම - 2024 " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

I. තනතුරු :
   (i) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති
   (ii) ගුරු විද්‍යාල විදුහල්පති
   (iii) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති

   (පුරප්පාඩු පවතින තනතුරු සහ සේවා ස්ථානයන් උපලේඛනය I හි දක්වා ඇත)

II. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය - 2024.07.12

III. ලියාපදිංචි තැපෑලට යොමු කිරීමට ප්‍රථම සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පතේ ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළ යුතු වේ.
E- mail = moesltes.branch@gmail.com
Subject = Appointment of the Officers in Grade I of the Sri Lanka Teacher Educators' Service to the Posts – 2024 (Name & ID No)

**02. තෝරා ගැනීමේ ක්‍රමය :**

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/ 37 සහ 2015.07.28 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 11 වන ඡේදය අනුව ඉහත තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් විසින් ලබාගන්නා ලකුණුවල ප්‍රමුඛතාව මත, අයදුම්කරුගේ මනාපය හා සේවා අවශ්‍යතාවය පරිදි අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය ද සැලකිල්ලට ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තනතුරුවලට පත්කරනු ලැබේ.

II. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ උපලේඛනය V පරිදි, අදාළ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලබනුයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අවම සමත් ලකුණු ප්‍රමාණය වන ලකුණු 35ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධාරීන් පමණි.

III. ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ උපලේඛනය II යටතේ දක්වා ඇත.

IV. ඉල්ලුම් කිරීමට කැමති සේවා ස්ථාන සහ තනතුරු අපේක්ෂිත අනුපිළිවෙළ අනුව අයදුම්පත්‍රයේ අංක 08 යටතේ සඳහන් කළ යුතුය. කුසලතාවය අනුව ඔබ විසින් ඉල්ලුම්කරන ලද තනතුරකට සුදුසුකම් නොලබන්නේ නම් සේවා අවශ්‍යතාවය මත වෙනත් සේවා ස්ථානයක තනතුරක් සඳහා පත් කිරීමට සලකා බලනු ලැබිය හැකිය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගේ අංක ESC/APP/SLTES/10/175/2017 දරන 2021.02.23 දිනැති ලිපිය අනුව නිට්ටඹුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපති තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතින්නේ භික්ෂූන් වහන්සේ නමකට පමණක් වන අතර උප පීඨාධිපති තනතුර සඳහා භික්ෂූන් වහන්සේලා හා ගිහි පිරිමි නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.

VI. පත්කිරීම් කරන ලද තනතුරක වැඩ භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට නිලධාරියාට අවස්ථාවක් ලබා නොදෙන බැවින් පත්වීම් ලද තනතුරේ අනිවාර්යයෙන් රාජකාරියට වාර්තා කළ යුතුය.

VII. අයදුම්පත්‍රයේ සඳහන් මනාප හා අනුපිළිවෙල පසු අවස්ථාවක වෙනස් කර ගැනීමට අවස්ථාවක් නැත.

VIII. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා කුසලතාව අනුව තනතුරක් ලබා දීම සඳහා සලකා බලනුයේ මෙම අදියර සඳහා පමණි.

IX. පරිපාලන පහසුව සඳහා තනතුරු සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් වෙන් කර පැවතිය ද අදාළ මාධ්‍යයෙන් සේවය කිරීමට හැකි ඕනෑම නිලධාරියකුට පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව පවතී.

X. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැරදි කරුණක් ඕනෑකමින් යටපත් කර ඇත්නම් හෝ තනතුරෙන් පහ කිරීමට ඉඩ ඇත.

03. **සුදුසුකම් :**

I. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 03 වන කාර්යක්ෂමතා කඩඉම සමත් I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනය නිකුත් කරන දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

04. අදාළ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

05. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

2024 ජූනි මස 24 වන දින

ජේ.එම්.තිලකා ජයසුන්දර

ලේකම්

උපලේඛනය I

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පත්කිරීම සඳහා
පවතින සහ ඉදිරියේ දී පුරප්පාඩු වන තනතුරු සහ සේවා ස්ථාන (2024.06.30 දිනට)

I. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ :

| අනු. අංකය | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පීඨාධිපති තනතුරු | | උප පීඨාධිපති තනතුරු | |
|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 1 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 01 | |
| 2 | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 3 | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 03 | - |
| 4 | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 01 | - |
| 5 | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 6 | වවුනියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | - | 03 |
| 7 | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | 03 | 01 |
| 8 | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | - | 02 |
| 9 | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | - | 01 |
| 10 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 03 | - |
| 11 | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 12 | රුහුණ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 01 | - |
| 13 | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | - | 02 |
| 14 | දර්ගා නගරය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | - | 03 |
| 15 | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 03 | - |
| 16 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | - | - |
| 17 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 02 | - |
| 18 | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 01 | - |
| 19 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | - | - |
| | | 11 | | 36 | |

II. ගුරු විද්‍යාල :

| අනු. අංකය | ගුරු විද්‍යාලය | ගුරු විද්‍යාල විදුහල්පති | |
|---|---|---|---|
| | | සිංහල | දෙමළ |
| 01 | අඩ්ඩාලච්චේනා ගුරු විද්‍යාලය | - | 01 |
| 02 | බලපිටිය ගුරු විද්‍යාලය | 01 | - |
| 03 | කෝප්පායි ගුරු විද්‍යාලය | - | 01 |
| 04 | මඩකලපුව ගුරු විද්‍යාලය | - | 01 |
| 05 | ගම්පොළ ගුරු විද්‍යාලය | 01 | - |
| | | 02 | 03 |